# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2187/18 - 2020 අගෝස්තු මස 05 වැනි බදාදා - 2020.08.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: DIVWE/LND/ACQUI/05/08.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/4/2016/LO/175.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතින් (සංශෝධිත) පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ / පරවශතාවයේ විස්තර :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෝනව ගමේ පිහිටි මු.පි.කු. 2451හි කැබලි අංක 01.

**කැබලි අංක 01**

ඉඩමේ නම: ශාන්ත බ්‍රිජට් වත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 45 - 50 වයස ඇති සියඹලා ගස් 03 ක්, අවුරුදු 25 - 40 ක් වයසැති පොල් ගස් 22 ක්, අවුරුදු 15 - 25 ක් වයසැති පොල් ගස් 20ක්, අවුරුදු 15-25 වයසැති අඹ ගස් 05 ක්, අවුරුදු 15 - 25 ක් වයසැති කොස් ගස් 03 ක්, අවුරුදු 10 - 25 ක් වයසැති තේක්ක ගස් 05 ක්, අවුරුදු 08 - 15 ක් වයසැති අඹ ගස් 06ක්, මිශ්‍ර වගාවක්, ස්ථිර ගොඩනැගිලි 09ක්, වතුර ටැංකියක්, නළ ළිඳක් සහ සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් ඇත; හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.7944 (අක්කර 01 රූඩ් 03 පර්චස් 34.1)

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ තමන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් 2020 ඔක්තෝබර් 12 වැනි දින පෙ. ව. 10.00 ට, වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2020 ඔක්තෝබර් මස 05 වන දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම / පරවශ්‍යතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දනුම්දිය යුතු ය.

ඊ. එම්. එස්. පී. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
වීරඹුගෙදර.

2020 ජූලි මස 31 වැනි දින,
වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 460

## ශුද්ධිපත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: WEG/LAN/L9/ACQ/48-18.

ඉහත කරුණ සම්බන්ධව අංක 1948/57 හා 2016 ජනවාරි 08 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීම වෙත අවධානය යොමු කෙරේ. එම දැන්වීමේ කැබලි අංක 18හි ප්‍රමාණය හෙක්ටයාර් 0.0011 යනුවෙන් සඳහන් වේ.

එම දැන්වීමේ "ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 0.0002 වශයෙන්" මෙයින් සංශෝධනය කරනු ලැබේ.

කේ. පී. ජී. සුමිත් ශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
වැලිගම.

2020 ජූලි මස 23 වැනි දින,
වැලිගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

08 - 461

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.